# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 අප්‍රේල් මස 23 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2021.04.28 දින නිකුත් කරන ලදී)**


# ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මයන්ත දිසානායක මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 56.00 තැපැල් ගාස්තුව : රු. 35.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය
## (සංස්ථාගත කිරීමේ)

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

“ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය” යන නමින් හඳුන්වනු ලැබූ සහ කැඳවනු ලැබූ රක්ෂණ වෘත්තිකයන්ගේ සංගමය, මේ වනතෙක් එහි සාමාජිකයන් එකඟ වී ඇති එහි ව්‍යවස්ථාවට අනුව ඒ හා සම්බන්ධ සියලු විෂයයන් කාර්යක්ෂමව සිදු කිරීමේ අරමුණ සඳහා සහ ගනුදෙනු කිරීම සඳහා ස්ථාපිත කර ඇති හෙයින් ද:

එකී ආයතනය මේ වනතෙක් ස්ථාපිත කර ඇති විෂයයන් සහ අරමුණු කීපයක් සාර්ථකව ඉටුකර ඇති හෙයින් ද, සංස්ථාගත කිරීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද, එයට අනුමැතිය ලබාදීම මහජන සුබසිද්ධියට හේතුවන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2021 අංක දරන ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය සංස්ථාගත කිරීම

**2.** (1) මෙම පනත සම්මත වූ දින සිට සහ ඉන් පසුව ඉහත කී ආයතනයෙහි සභාපති, උපසභාපති, ගරු ලේකම්, ගරු උපලේකම්, ගරු භාණ්ඩාගාරික සහ සම සභා සාමාජිකයන් සහ ඉහත කී ආයතනයේ වර්තමාන සාමාජිකයන් ව සිටින සියලු දෙනා මෙයින් සංස්ථාගත කරනු ලබන ආයතනයෙහි සාමාජිකයින් වශයෙන් මින්මතුවට පිළිගත යුතු ය. මොවුන්ගේ නම් (3) වෙනි කොටසේ සඳහන් ලේඛනයේ කර තිබෙන අතර මෙහි සඳහන් කර ඇති ආකාරය අනුව සීමිත වගකීම් සහිත ආයතනයක් බවට පත්වේ. මෙය ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය යන නමින් සහ ශෛලියෙන් සදහටම පවත්වාගෙන යනු ලබන අතර, එම නමින් නඩු පැවරීමට හෝ නඩු පවරනු ලැබීමට හැකිවන අතර, ඔවුන්ගේ සම්පූර්ණ බලය සහ අධිකාරිය සමග පොදු මුද්‍රාවක් භාවිතා කිරීමට සහ එය වෙනස් කිරීමට බලය ඇත්තේ ය.

(2) මෙම පනතෙහි භාවිතා කරනු ලබන "ආයතනය" යන යෙදුමෙන් හඳුන්වනු ලබන්නේ මෙයින් සංස්ථාගත කරනු ලබන ඉහත කී "ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය"යි.

ආයතනයෙහි සාමාජිකත්වය සඳහා සුදුසුකම්

**3.** (1) පහත සඳහන් පුද්ගලයින් (18,19,20,21, සහ 22) යන වගන්තිවල විධිවිධානවලට යටත්ව සුදුසුකම් ලබති:—

(අ) සාමාන්‍ය සාමාජිකත්වය සඳහා —

(i) එක්සත් රාජධානියෙහි වරලත් රක්ෂණ ආයතනයෙහි සහ සාමාජිකයකු හෝ ආශ්‍රිත සාමාජිකයකු සිටින ඕනෑම අයෙක් හෝ ඉහත කී සුදුසුකම්වලට සමාන යැයි සභාව විසින් නිර්දේශ කරනු ලබන වෙනත් රක්ෂණ වෘත්තීය සුදුසුකම් සහිත පුද්ගලයන්;

(ii) ආයතනය විසින් පවත්වනු ලබන ඩිප්ලෝමා හෝ ඒ හා සමාන වෙනත් සුදුසුකම් ලබාගැනීම සඳහා වූ විභාග හෝ ආයතනය විසින් පවත්වනු ලබන විභාගවලින් සමත්වීමෙන් අනතුරුව පිළිගත් රක්ෂණ සමාගමක හෝ වෙනත් තැරැව්කාර සමාගමක වසර තුනක (3) ප්‍රායෝගික පුහුණුව ලත් පුද්ගලයන්; නැතහොත්

(iii) රක්ෂණ කර්මාන්තයේ අවම වශයෙන් වසර (5) කළමනාකරණ තනතුරක සේවය කර ඇති ඕනෑම පුද්ගලයෙක් සභාවේ අභිමතය පරිදි පිළිගනු ලැබිය හැකි ය.

(ආ) *ලියාපදිංචි සාමාජිකත්වය සඳහා* — උප වගන්ති (1) යටතේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් නොලබන එහෙත් සභාව තම අභිමතය පරිදි පිළිගැනීමට තීරණය කරනු ලැබිය හැකි පුද්ගලයන් ;

(ඇ) *ගරු සාමාජිකත්වය සඳහා* — ආයතනයෙහි සාමාජිකත්වය දැරීම හේතුවෙන් ආයතනයට ගෞරවයක් ලැබෙන එමෙන්ම ආයතනයෙහි අරමුණු ප්‍රවර්ධනය කළ හැකි යැයි සභාව අදහස් කරන පුද්ගලයෙක් ගරු සාමාජිකත්වය දැරීම සඳහා කැඳවනු ලැබිය හැකි ය; සහ

(ඈ) *යාවජීව සාමාජිකත්වය සඳහා* — සභාව විසින් වරින්වර නිශ්චය කරනු ලබන ගාස්තුව ගෙවා යාවජීව සාමාජිකයෙක් වීම තුළින් ආයතනයට කීර්තියක් අත්වනු ඇතැයි සභාව අදහස් කරන පුද්ගලයන්.

(2) මෙහි ඉහත සඳහන් කර ඇති ආකාරයට පිළිගෙන ඇති ආයතනයෙහි සාමාජිකයන් පිළිබඳව ලේඛනයක් ආයතනය විසින් පවත්වාගෙන යා යුතු ය.

සාමාජිකයන් වර්ගීකරණය කිරීම

**4.** (1) ආයතනයෙහි සාමාන්‍ය සාමාජිකයන් පහත සඳහන් වර්ග තුනකින් (3) සමන්විතයි:—

(අ) ආයතනය විසින් ප්‍රදානය කරනු ලබන ඩිප්ලෝමාධාරීන් ; සහ

(ආ) සභාව විසින් පිළිගත හැකි ආයතනයක ආශ්‍රිත සාමාජිකයන්; සහ

(ඇ) සභාව විසින් පිළිගත හැකි සේවා පළපුරුද්ද.

(2) ආයතනය විසින් පවත්වනු ලබන රක්ෂණ ඩිප්ලෝමාව සම්පූර්ණ කර ඇති සහ සභාව විසින් නිර්දේශ කරනු ලබන නිර්ණායකයන් සම්පූර්ණ කර ඇති ආයතනයෙහි සාමාන්‍ය සාමාජිකයන්, මොවුන් මේ සම්බන්ධයෙන් ආයතනයට" අයදුම් කර ආයතනයෙහි ඩිප්ලෝමාධාරීන් වශයෙන් නිශ්චිත ගාස්තුව ගෙවා එය සමාගම පිළිගනු ලැබීමෙන් අනතුරුව "Dip.SLII" යන පසු යෙදුම භාවිත කිරීමට සුදුසුකම් ලබති.

(3) සභාව විසින් නිර්දේශ කරනු ලබන නිර්ණායකයන් සම්පූර්ණ කරන ආයතනයෙහි සෑම සාමාන්‍ය සාමාජිකයෙක්ම ඒ සම්බන්ධයෙන් සභාවට අයදුම් කර නිශ්චය කරනු ලබන ගාස්තුව ආයතනයට ගෙවා, ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකයෙක් වශයෙන් සභාව විසින් ලියාපදිංචි කරනු ලැබීමෙන් අනතුරුව "ASLII" යන පසු යෙදුම භාවිතා කිරීමට සුදුසුකම් ලබති.

(4) සභාව විසින් නිර්දේශ කරනු ලබන නිර්ණායකයන් සම්පූර්ණ කරන ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකයෙක් ඒ සම්බන්ධයෙන් සභාවට

අයදුම් කර නිශ්චය කරනු ලබන ගාස්තුව ආයතනයට ගෙවා ආයතනයෙහි සහ සාමාජිකයෙක් වශයෙන් සභාව විසින් ලියාපදිංචි කරනු ලැබීමෙන් අනතුරුව "SLII" යන පසු යෙදුම භාවිතා කර ආයතනයෙහි සහ සාමාජිකයෙක් වශයෙන් තමන් හඳුන්වා ගැනීමට සුදුසුකම් ලබති.

(5) ඉහත කී උපවගන්ති (2) (3) සහ (4), වල සඳහන් ශීර්ෂයන් සහ පසු යෙදුම් සභාව විසින් පිළිගෙන තිබුණහොත් මිස කිසිම පුද්ගලයකු භාවිතා නොකළ යුත්තේ ය.

දේපළ, අයිතීන් සහ ආයතනය වෙත පැවරී ඇත වගකීම්

**5.** (1) මෙම පනත ආරම්භවීමත් සමගම ඉහත කී "ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයට" අයිති චංචල සහ නිශ්චල දේපළ සහ එය ඒ නමින් හෝ ඒ සඳහා වූ විශ්වාසය මත වෙනත් යම් පුද්ගලයකුගේ හෝ පුද්ගලයන්ගේ නමින් හෝ නම් වලින් තිබුණ ද, ඒ සියල්ල මෙයින් සංස්ථාගත කරනු ලබන ආයතනය නමට මාරුවිය යුතු ය. සියලු දයක මුදල්, වාරික මුදල්, පරිත්‍යාග, දඩ මුදල්, ණය මුදල් සහ ලබාගෙන ඇති සහ ලැබීමට නියමිත පූර්ව ගෙවීම් දැනට ආයතනයෙහි නියමයන් සහ රෙගුලාසිවලට යටත් ව මෙම පනතෙහි අරමුණ සඳහා ආයතනයේ සන්තකයේ තබා තිබිය යුතු ය.

(2) ඉහත සඳහන් කරන ලද "ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය" විසින් සහ එහි අරමුණු වෙනුවෙන් ඇතිකර ගන්නා ලද සහ මෙම පනතේ ආරම්භයට පෙර දිනයක ක්‍රියාත්මකව පවතින සියලු ගිවිසුම් සහ කොන්ත්‍රාත් මෙයින් සංස්ථාගත කරනු ලබන ආයතනය නමින් විය යුතු අතර, ඒ සියල්ල ආයතනය විසින් ඇති කරගන්නා ලද ගිවිසුම් සහ කොන්ත්‍රාත් වශයෙන් සැලකිය යුතු ය.

එසේ වුව ද මෙතුවක් කල් හෝ මින්මතුවට ආයතනය විසින් තම භාරයේ තබාගන්නා ලද හෝ භාරකරු වශයෙන් බෙදදිය යුතු බවට වූ කොන්දේසියට යටත් වූ හෝ යටත් නොවූ යම් ප්‍රතිපාදනයක හෝ තෙස්තමේන්තුවක කොන්දේසිවලට යටත්ව භාරයේ තබා ඇති යම් නිශ්චල හෝ චංචල දේපළ සැමවිටම ආයතනය විසින් භාරයේ තබාගත යුතු ය හෝ ඉහත සඳහන් කොන්දේසිවලට යටත් ව හෝ යටත් නොවී එකී දේපළ සම්බන්ධයෙන් ආයතනය මත පනවනු

ලැබිය හැකි වගකීම්වලට යටත්ව භාරය සම්බන්ධයෙන් ලිඛිත නීතියක විධිවිධානයේ කොන්දේසිවලට යටත්ව තබාගත යුතු ය.

**"ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය" විසින් ගෙවිය යුතු සහ එයට ලැබිය යුතු ණය**

**6.** මෙම නීතිය ක්‍රියාත්මක වන අවස්ථාවේ දී "ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය" විසින් පියවිය යුතුව තිබෙන ණය සහ ඉටුකල යුතු වගකීම් මෙයින් සංස්ථාගත කරනු ලබන ආයතනය විසින් පියවිය යුතු සහ ඉටුකළ යුතු වන අතර, ඉහත කී ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයට අයවිය යුතු ණය, දායක මුදල් සහ දඩ මුදල් මෙයින් සංස්ථාගත කරනු ලබන ආයතනයට ගෙවිය යුතු ය.

**ආයතනය විසින් දේපළ රඳවා තබා ගැනීම**

**7.** මිලදී ගැනීම්, ප්‍රතිපාදන, ප්‍රදාන හෝ බදු යනාදිය මගින් හෝ වෙනත් ආකාරයකින් චංචල හෝ නිශ්චල දේපළක් එහි පූර්ණ අයිතිකරු වශයෙන්, ප්‍රතිලාභ ලබන අයිතිකරු වශයෙන් හෝ භාරකරු වශයෙන් ලබා ගැනීමට හෝ තබා ගැනීමට හැකි අතර, එවන් සියලු දේපළ ආයතනය විසින් තබාගත යුතු ය:

(අ) මෙම පනතේ අරමුණු සඳහා සහ ආයතනයෙහි වර්තමාන නියමයන් සහ රෙගුලාසිවලට යටත්ව; හෝ

(ආ) එසේ නොමැතිනම්, භාරයක අරමුණු සඳහා ඒ මත සහ ඒ හා සම්බන්ධ මෙවලම් හෝ අන්තර්ගතවී ඇති බෙදා දීමේ නියමයන් යනාදියෙහි කොන්දේසිවලට යටත් ව සම්පූර්ණ බලය යොදා අලෙවි කිරීමට, උකසට තැබීමට, හුවමාරු කිරීමට හැකි ය. නොඑසේ නම්, වෙනත් ආකාරයකට ලබා දීමට හෝ සම්බාධක පැනවීමට හෝ අයකිරීමට හෝ එය රඳවාගෙන ගනුදෙනු කළ හැකි ය.

**සාමාජිකයන්ගේ වගකීම්වල සීමාවන්**

**8.** (1) මෙම පනත යටතේ ආයතනයෙහි එක් එක් සාමාජිකයන්ගේ වගකීම් රුපියල් 150.00 (එකසිය පනහ) කට සීමා කර ඇත. මෙයට අමතරව එවැනි වාර්ෂික දායක මුදලක් වෙතොත් එය අදාළ සාමාජිකයා විසින් ආයතනයට ගෙවිය යුතු ය.

(2) සාමාජිකයන් විසින් ආයතනය වෙත ගෙවිය යුතු වාර්ෂික දායක මුදල පිළිබඳව සභාව විසින් වරින්වර සඳහන් කරනු ඇත.

ආයතනයේ අරමුණු

**9.** පහත සඳහන් කර ඇති අරමුණු සඳහා ආයතනය සංස්ථාගත කර ඇති බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(1) රක්ෂණ ක්ෂේත්‍රයේ නියැලී සිටින හෝ සේවය කරනු ලබන පුද්ගලයන් අතර, ඔවුන් ආයතනයේ සාමාජිකයන් වූවත් නොවූවත් ඔවුන්ගේ පෞද්ගලික අභිවෘද්ධිය උදෙසා පමණක් නොව එකී ව්‍යාපාරය වඩාත් ඵලදායක වන අන්දමින් පවත්වාගෙන යාමටත් රක්ෂණ වෙළෙඳපොළෙහි වෘත්තීයමය හැසිරීමකට අවශ්‍ය තත්ත්වයක් ඇති කර පවත්වාගෙන යාම සඳහා වන කාර්යක්ෂමතාවය සහ අභිවෘද්ධිය සංවර්ධනය කිරීම සඳහාත් ඔවුනතර පොදු සහ වෘත්තීය වර්ධනයක් ඇති කිරීමටත් මධ්‍යම ආයතනයක් ඇති කර පවත්වාගෙන යාම;

(2) සභාව විසින් නිර්දේශ කරනු ලැබිය හැකි නිර්ණායකයන් සම්පූර්ණ කර ඇති රක්ෂණ වෘත්තිකයන් සඳහා ආයතනයෙහි අදාළ සහතික කිරීම් සහ පිළිගැනීම ලබා දීම ඇතුළු එහෙත් එයට පමණක්ම සීමා නොවී රක්ෂණ වෘත්තීය සුදුසුකම් ලබා ඇති පුද්ගලයන් සහතික කර ඔවුන්ට සහතික පත්‍ර ප්‍රදානය කිරීම;

(3) සාමාජිකත්වය ලබා ඇති සහ ලබා නොමැති පුද්ගලයන් අතර රක්ෂණ ක්ෂේත්‍ර අධ්‍යාපනය දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(4) පිළිගත් ජාතික අධ්‍යාපන ආයතන වේවා, ජාත්‍යන්තර අධ්‍යාපන ආයතන වේවා, එමගින් රක්ෂණයේ කුමන හෝ විෂයයන් පිළිබඳ වෘත්තීමය දැනුමක් ලබාගැනීමට දිරිමත් කිරීම සහ සහයෝගය ලබාදීම;

(5) රක්ෂණ විෂයයට අදාළ හෝ රක්ෂණය හා සම්බන්ධ අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම සහ යම් පුද්ගලයන් හෝ ආයතන සඳහා සහ ඔවුන් වෙනුවෙන් විභාග පැවැත්වීම;

(6) සඟරාවක් ප්‍රකාශයට පත්කිරීම සහ සභාව විසින් පිළිගත හැකි වෙනත් යම් විෂයයන් පිළිබඳ මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීම;

(7) රක්ෂණ ක්ෂේත්‍රය හා සම්බන්ධ ඕනෑම විෂයයක් පිළිබඳ ලිපි හෝ පර්යේෂණ වෙනුවෙන් තිළිණ ප්‍රදානය කිරීම;

(8) රක්ෂණය හා සම්බන්ධ සියලු මෙහෙයුම් ක්ෂේත්‍රවලට අදාළ නීති සහ ක්‍රියාදාමයන් පිළිබඳ පර්යේෂණ සිදුකිරීම සහ සවිමත් විශේෂඥ කමිටුවක් ඇති කිරීම;

(9) ආයතනයේ සාමාජිකයන් සම්බන්ධයෙන් වෘත්තීය අධීක්ෂණයක් සහ පාලනයක් ක්‍රියාත්මක කිරීම, ඔවුන්ගේ අයිතීන් සහ සුබසාධනය ආරක්ෂා කිරීම, ඔවුන්ගේ අභිවෘද්ධිය තවත් තීව්‍ර කිරීම සහ පොදුවේ රක්ෂණ වෘත්තිකයන්ගේත් විශේෂයෙන් ආයතනයේ සාමාජිකයන්ගේත් තත්ත්වය ඉහළ නැංවීමට සමත් සියලු දේ දිරිමත් කිරීම;

(10) සාමාජිකයන් වෙනුවෙන් සමාජ සංසදයක් ඇති කිරීම;

(11) ආයතනයේ සාමාජිකයන් අතර පෞද්ගලික සහ මිත්‍ර සම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීම;

(12) වෘත්තීය කටයුතු, අයිතීන් සහ වගකීම් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සම්මේලන සහ රැස්වීම් පැවැත්වීම, නිර්මාණ ලිපි කියවීම් සහ දේශන පැවැත්වීම, සාමාජිකයන්ගේ අයිතීන් පිළිබඳ ලැයිස්තු, ලේඛන සහ සිදුවීම් වාර්තා සකස් කිරීම, ආයතනයේ සාමාජිකයන්ට වරින්වර ඉහත කී ලැයිස්තුවල ලේඛනවල සහ වාර්තාවල පිටපත් සැපයීම;

(13) සියලු ආකාරයේ ප්‍රශ්න, ගැටලු සහ රක්ෂණය සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය හා සම්බන්ධ අනෙකුත් විෂයයන් පිළිබඳ සැළකිලිමත් වීම;

(14) රක්ෂණයට සහ රක්ෂණ ක්ෂේත්‍රයට බලපෑ හැකි පනත් සහ අනෙකුත් විෂයයන් දිරිමත් කිරීමට හෝ විරෝධය පෑමට ප්‍රයත්න දැරීම;

(15) රක්ෂණය සහ රක්ෂණ ව්‍යාපාරය හා සම්බන්ධ දත්ත සහ අනෙකුත් තොරතුරු රැස්කිරීම සහ සැපයීම;

(16) රක්ෂණය සහ රක්ෂණ ව්‍යාපාරය හා සම්බන්ධ විෂයයන් පිළිබඳව රාජ්‍ය ආයතන, නියාමකයන්, වෙනත් ස්ථානවල හෝ රටවල්වල පවතින මෙයට සමාන සංගම් සහ තනි පුද්ගලයන්ට උපදෙස් ලබා දීම සහ සන්නිවේදන පැවැත්වීම;

(17) ආයතනයේ අරමුණු සඳහා ණය ලබාගැනීම හෝ මුදල් සපයා ගැනීම සහ එකී අරමුණ සඳහා හෝ ආයතනයේ යම් රාජකාරි හෝ වගකීම් ඉටු කිරීමට හෝ සම්පූර්ණ කිරීමට හෝ යම් උකස්, බැඳුම්කර නිර්මාණය කිරීම, ප්‍රතිපාදන සැපයීම හෝ ආයතනයේ වගකීම් ඉටු කිරීම සඳහා මුදල් ආරක්ෂිතව තබා ගැනීම සහ එමගින් ලබා ගන්නා ලද මුදල් සහ එයින් කොටසක් හෝ කොටස් ගෙවීම හෝ නැවත ණය ලබා ගැනීම;

(18) ආයතනයේ අරමුණු සඳහා චංචල හෝ නිශ්චල දේපළක් මිලදී ගැනීම, විකිණීම, බද්දට ගැනීම හෝ වෙනත් යම් ආකාරයකින් ගනුදෙනු කිරීම;

(19) ඉහත කී සියල්ල හෝ එයින් යම් විෂයයක් ලෝකයේ ඕනෑම ස්ථානයක දී ප්‍රධානියා, නියෝජිතයන්, භාරකරුවන් වශයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් සිදුකිරීම සහ නියෝජිතයන්, භාරකරුවන් හෝ වෙනත් කෙනෙක් මාර්ගයෙන් සහ වෙන්ව සහ අනිත් අය හා සම්බන්ධවී සිදුකිරීම; සහ

(20) රක්ෂණ ක්ෂේත්‍රයේ සහ රක්ෂණ වෘත්තිකයන්ගේ සමාජයේ සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයෙහි අයිතියට හෝ සුබසාධනයට හෝ ඉහත කී අරමුණු සියල්ල හෝ එයින් ස්වල්පයක් ළඟාකර ගැනීමට හෝ පොදුවේ රක්ෂණයට සහ ශ්‍රී ලංකා රක්ෂණ ක්ෂේත්‍රයෙහි සුබසිද්ධියට, ආරක්ෂාවට හෝ සංවර්ධනයට අත්‍යාවශ්‍ය හෝ ගැලපෙන අනෙකුත් සියලු වැඩකටයුතු සිදුකිරීම.

උපලේඛනයේ නියමයන් ආයතනයේ ද නියමයන් වේ

**10.** (11) වෙනි වගන්තියෙහි විධිවිධානවලට යටත්ව උපලේඛනයෙහි සඳහන් කර ඇති නියමයන් සියලු අරමුණු සඳහා ආයතනයේ නියමයන් වන අතර, එහි කටයුතු සහ එහි සාමාජිකයන් එමගින් පාලනය වේ:

එසේ වුව ද, මෙම කොටසේ අන්තර්ගත යමක් මින් මතුවට නව නියමයන් පැනවීම, එකතු කිරීම හෝ උපලේඛනයේ ඇති හෝ (11) වෙනි වගන්තියට යටත් ව ඉන් අනතුරුව ආයතනය විසින් සිදුකරනු ලැබිය හැකි නියමයන් අවලංගු කිරීමෙන් කිසිවිටෙක ආයතනය වළක්වනු ඇතැයි අදහස් නොකළ යුතු ය.

නීති රීති සංශෝධනය කිරීම

**11.** (1) මහා සභා රැස්වීමකට සහභාගී වී සිටින සාමාන්‍ය සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක බහුතරයකින් සම්මත කරන ලද සම්මුතියක් මගින් උපලේඛනයෙහි සඳහන් නීතිරීති වෙනස් කරනු ලැබිය හැකි ය.

එසේ වුවද, ඉහත රැස්වීම් පැවැත්වීමට අවම වශයෙන් දින දහතරකට (14) පෙර සියලුම සාමාන්‍ය සාමාජිකයන්ට ඉහත රැස්වීමේ දී ඉදිරිපත් කිරීමට නියමිත සංශෝධනයක් ඉදිරිපත් කිරීමේ යෝජනාව පිළිබඳව ලිඛිත දැන්වීමක් යැවිය යුතු ය.

(2) මහා සභා රැස්වීමක දී ආයතනය විසින් සම්මත කරගෙන ඇති යෝජනාවක් ඉන් පසුව පවත්වනු ලැබූ රැස්වීමක දී සහභාගී වූ සාමාජිකයන් බහුතරයක් පක්ෂව ඡන්දය ප්‍රකාශ කර තිබුණහොත් මිස සංශෝධනය කිරීම, එකතු කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම නොකළ යුතු ය:

එසේ වුව ද, ඉහත රැස්වීම පැවැත්වීමට අවම වශයෙන් දින දහතරකට (14) පෙර සියලුම සාමාන්‍ය සාමාජිකයන්ට ඉහත රැස්වීමේ දී ඉදිරිපත් කිරීමට නියමිත සංශෝධනයක් ඉදිරිපත් කිරීමේ යෝජනාව පිළිබඳව ලිඛිත දැන්වීමක් යැවිය යුතු ය.

ආයතනයට නීතිරීති සම්පාදනය කළ හැකිවීම

**12.** සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී සහභාගී වී ඇති සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක බහුතර ඡන්දයක් මගින් වරින් වර පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් ආයතනය විසින් සම්පාදනය කරනු ලබන සහ ගනු ලබන තීරණ නීත්‍යානුකූල ස්වරූපයක් ගනු ඇත:—

(1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම හෝ ඉවත් කිරීම හෝ ඉල්ලා අස්කර කර ගැනීම;

(2) දඩ මුදල් නියම කිරීම සහ නීතිරීති උල්ලංඝනය කිරීමට එරෙහිව අභිමි කරලීම;

(3) සභාවේ නිලධාරින්ගේ ධුර කාලය තීරණය කිරීම;

(4) සභාවේ සහ එහි සාමාජිකයන්ගේ වගකීම් තීරණය කිරීම;

(5) වෘත්තීයමය අවකල් ක්‍රියාවෙහි අනුශංගය ඇතුලු ආයතනයෙහි සාමාජිකයන් විසින් පිළිපැදිය යුතු චර්යාධර්ම සංග්‍රහයක් සම්පාදනය කිරීම;

(6) මහා සභා රැස්වීමක කටයුතු සිදුවිය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ක්‍රියා පටිපාටි;

(7) සභාවේ සාමාජිකයකුගේ නිල කාලය අවසන් කිරීම; හෝ

(8) සභාවක් තෝරා පත් කර ගැනීම සහ එහි වගකීම්.

**13.** (1) ආයතනයට සභාවක් ඇත. එය මෙම පනත යටතේ "සභාව" වශයෙන් හඳුන්වනු ලැබේ: සභා ව්‍යවස්ථාව.

ආයතනයේ වැඩකටයුතු මින් අනතුරුව සභාව විසින් නියම කරනු ලබන පරිදි දැනට පවතින ආයතනයේ නීතිරීතිවලට යටත්වේ.

(2) දැනට පවතින නීතිරීතිවලට සපයා ඇති පරිදි සාමාන්‍ය සාමාජිකයන් අතුරින් තෝරා පත්කර ගනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සභාව සමන්විත වේ:—

(අ) සභාපති;

(ආ) උප සභාපති;

(ඇ) ගරු ලේකම්;

(ඈ) ගරු උප ලේකම්;

(ඉ) ගරු භාණ්ඩාගාරික; සහ

(ඊ) සම සභා සාමාජිකයන් සය දෙනෙක්.

(3) මෙම පනතෙහි "සභාපති", "උප සභාපති", "ලේකම්", "උපලේකම්", "භාණ්ඩාගාරික" සහ "සම සභා සාමාජිකයන්" වශයෙන් සඳහන් වන යෙදුම් ඉහත (2) උප වගන්තිය යටතේ තේරී ඇති සාමාජිකයන් පිළිවෙලින් හඳුන්වයි.

(4) ආයතනයෙහි පළමුවෙනි සභාව (නම්) ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයෙහි සභා සාමාජිකයන්ව සිටින පිළිවෙලින් වර්තමාන සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ සම සභා සාමාජිකයන් සමන්විතයි.

(5) සභා සාමාජිකයන් වශයෙන් ක්‍රියාත්මක වීම වෙනුවෙන් සහ වගකීම් ඉටු කිරීම වෙනුවෙන් සභාවේ කිසිම සාමාජිකයකුට කිසිම ගෙවීමක් කරනු නොලැබේ.

සභාවේ සාමාන්‍ය බලතල සහ රාජකාරි.

**14.** (1) ආයතනයේ පරිපාලනය සහ කළමනාකරණය සභාව සතු කාර්යයක් වන අතර, මෙම පනතෙහි විධිවිධාන සහ මෙම පනත මගින් සභාව මත පැවරී ඇති සහ ලබා දී ඇති කටයුතු සහ වගකීම් ඉටු කිරීම සභාවෙහි වගකීමක් වේ.

(2) සභාවෙහි වගකීම් පහත සඳහන් වේ:—

(අ) ආයතනයෙහි සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලැබීමේ විභාග පැවැත්වීම හෝ පැවැත්වීමට පහසුකම් සැපයීම සහ එකී විභාග සඳහා වූ විෂයයන් නිර්දේශ කිරීම හෝ පිළිගැනීම;

(ආ) ආයතනයෙහි සාමාජිකයන් පිළිබඳ ලේඛනයක් පවත්වා ගැනීම සහ ප්‍රකාශයට පත් කිරීම;

(ඇ) වෘත්තීය අවකල් ක්‍රියාවෙහි අනුශංග පිළිබඳව සාමාජිකයන්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සහ වරින්වර ඒ සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම ඇතුළු ආයතනයේ සාමාජිකන් සඳහා චර්යාධර්ම පද්ධතියක් පිළියෙල කිරීම;

(ඈ) ආයතනයේ සාමාජිකයන් අතර වෘත්තීයමය තත්ත්වයන් පවත්වා ගැනීම සහ එකී තත්ත්වයන් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රමෝපායන් සහ ක්‍රියා පටිපාටි පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම;

(ඉ) සභාවේ සියලු රැස්වීම්වලට සහ ආයතනයේ සියලු මහා සභා රැස්වීම්වලට සහභාගිවීම, එය සංවිධානය කිරීම සහ දයක වීම ;

(ඊ) සෑම වාර්ෂික මහා සභා රැස්වීමක දී ම ආයතනයේ මූල්‍ය හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳව සහ ඉකුත් වර්ෂයේ දී ආයතනයේ කටයුතු සහ ක්‍රියා පටිපාටි පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම;

(උ) මහජනතාව අතර රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දිරිමත් කිරීම සහ එය වැඩිදියුණු කිරීම;

(ඌ) රක්ෂණය හා සම්බන්ධ පොත්පත්, සඟරාවලින් සමන්විත පුස්තකාලයක් පවත්වාගෙන යාම සහ ශ්‍රී ලංකාවේ එවැනි පොත් මුද්‍රණය කිරීම දිරිමත් කිරීම ; සහ

(එ) රක්ෂණ විෂයය පිළිබඳව ශ්‍රී ලංකාවේ දී පර්යේෂණ සිදුකිරීම දිරිමත් කිරීම, පොදුවේ ගත්කළ රක්ෂණ ක්ෂේත්‍රයේ සුබසාධනය සහ අභිවෘද්ධිය ආරක්ෂා කිරීම.

(3) පහත සඳහන් විෂයයන් පිළිබඳව සභාවට බලය සහ හැකියාවන් ඇත:—

(අ) සුදුසුයැයි අදහස් කරනු ලැබුවහොත් ආයතනය විසින් පවත්වනු ලබන විභාගවලින් නිදහස් කිරීම සඳහා වන සුදුසුකම් පිළිබඳ නිර්ණායකයන් යෝජනා කිරීම;

(ආ) ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යාපනික වැඩසටහන් වලට අදාළ විෂයයන් නිර්දේශ කිරීම සහ නිශ්චය කිරීම;

(ඇ) හවුල් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් ආයතන සමග ගිවිසුම්වලට එළඹීම;

(ඈ) ආයතනයේ සහ සියලුම කමිටුවල රාජකාරි පාලනය කිරීම, සහයෝගය දැක්වීම සහ මෙහෙයවීම සහ ආයතනයේ සුබසාධනය සඳහා හදිසි තීරණ අවශ්‍යවන සියලු කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම;

(ඉ) ආයතනයේ අරමුණු එහි කටයුතු ඉටුකරගැනීම සඳහා ඔවුන්ගේම ක්‍රියාපටිපාටියක් නියාමනය කිරීම;

(ඊ) ආයතනයේ ආදායම, දේපළ සහ කටයුතු පිළිබඳ පාලනය සහ කළමනාකරණය නතු කර ගැනීම;

(ඨ) බලතල පාවිච්චි කිරීම සහ ආයතනය විසින් මෙහෙයවනු ලබන සියලුම විෂයයන් සහ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම;

(ඩ) සුදුසුයැයි සලකනු ලබන නියමයන් සහ කොන්දේසිවලට යටත් ව ආයතනයට නිලධාරීන් බඳවා ගැනීම සහ වැටුප් ලබන නිලධාරීන් ඉවත් කිරීම;

(එ) ආයතනයේ අරමුදල්වලින් කොටසක් පොත්පත්, වාර්තා, දත්ත, ගිණුම්, ලිපිලේඛන, පිඹුරුපත්, සැලසුම්, මෙවලම්, ආකෘති සහ රක්ෂණ ක්ෂේත්‍රයේ සුබසිද්ධිය සඳහා වන අනෙකුත් කටයුතු සංවිධානය කිරීමට සහ එය ඉටු කිරීමට වියදම් කිරීම;

(ඒ) ආයතනයේ අවශ්‍යතාවන් සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදල ආයතනයේ නමින් වානිජ බැංකුවල සහ සභාව විසින් අනුමත කරනු ලබන රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම;

(ඔ) තාවකාලික මුදල් ණයට ගැනීම සහ ඒ සඳහා වූ පොලිය ගෙවීම;

(ඕ) ආයතනයේ අරමුදලෙන් කොටසක් කථිකාචාර්යවරුන් සහ පදනම් සඳහා වූ ගරු ගෙවීම් කිරීම හෝ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමටත් ප්‍රදර්ශන පැවැත්වීමටත් ආයතනය විසින් හෝ වෙනත් අධ්‍යාපන ආයතන විසින් පවත්වනු ලබන විභාගවල යම් විෂයයක් සම්බන්ධ ත්‍යාග සහ තිළිණ ප්‍රදානය කිරීම සඳහා යොදගැනීම;

(ක) ආයතනයේ අරමුණු සඳහා සහ ඉලක්කයට වේගයෙන් ළඟාවීම සඳහා ප්‍රයෝජනවත් විය හැකි සැලකිය හැකි ගිවිසුම්වලට එළඹීම සහ සියලුම වැඩකටයුතු ඉටු කිරීම;

(ග) අවශ්‍යවන පරිදි යම් බැංකුවක හෝ බැංකුවල ආයතනය නමින් ගිණුම් පවත්වා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම;

(ච) ආයතනයේ සාමාජිකයන්ගේ රැස්වීම පවත්වනු ලබන ස්ථානයක් ලෙස භාවිතා කිරීම සඳහා හෝ විද්‍යාලයක්,

දේශන ශාලාවක් හෝ පුස්තකාලයක් ලෙස හෝ සමාජ අරමුණු සඳහා හෝ ඉහත කී අරමුණු හෝ එයින් එක් අරමුණක් ඉටු කිරීම සඳහා භාවිතා කිරීමට වෙනත් දේපළක්, එය නිශ්චිත හෝ පෞද්ගලික දේපළක් වුව ද, ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි මිලදී ගැනීම, කුලියට ගැනීම, කල්බදු ක්‍රමයට ලබාගැනීම, රඳවාගැනීම හෝ විකිණීම;

(ඡ) ආයතනයේ අරමුණු හා සම්බන්ධ සහ එය ඉටුකිරීම සඳහා ත්‍යාග භාර ගැනීම හෝ පිරිනැමීම හෝ ප්‍රදානයන් ලබා දීම;

(ට) ආයතනයේ නියෝජිතයකු වශයෙන් හෝ ඒජන්ත වශයෙන් පුද්ගලයකු හෝ පුද්ගලයන් කිසිවෙක් පත් කිරීමේ අරමුණ සඳහා හෝ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක ඉහත කී සියලු හෝ යම් අරමුණක් සඳහා පුද්ගලයකුට හෝ කුමන හෝ පුද්ගලයකුට යම් කරුණක් යොමු කිරීමේ අරමුණ සඳහා ගිවිසුමකට හෝ කොන්ත්‍රාත්තුවකට එළඹීම හෝ වෙනත් යම් ලේඛනයක අත්සන් තැබීම සහ ඉටුකිරීම; නැතහොත් ;

(ඩ) සාමාන්‍යයෙන් ඉහත කී අරමුණු හෝ එයින් යම් කිසිවක් ඉටු කරගැනීම සඳහා අත්‍යවශ්‍ය හෝ සුදුසු සියලු පියවර සහ වෙනත් නීත්‍යානුකූල පියවර ගැනීම.

කමිටු

**15.** සභාව විසින් කමිටු පිහිටුවා සභාවේ සමහර බලතල ඔවුන්ට විමධ්‍යගත කරනු ඇත. නොඑසේනම්, එකඟත්වයට පැමිණෙන සමහර රාජකාරි ඔවුන් වෙත පවරනු ඇත. කමිටු ඔවුන්ගේ බලතල පාවිච්චි කිරීමේ දී සභාව විසින් ලබා දී ඇති නිර්දේශ පිළිපදින නමුත් වෙනත් සියලු කරුණු සම්බන්ධයෙන් ඔවුන්ගේ පෞද්ගලික අභිමතය පරිදි කටයුතු කරනු ඇත:

එසේ වුවද සභාපති, උප සභාපති, සහ ගරු ලේකම් යන නිලධාරීන් තම ධුරවලට අයත් බලතල අනුව විනය සහ ඇපෑල කමිටු හැර වෙනත් කමිටු රැස්වීම්වලට සහභාගීවීමට ඔවුන්ට බලය ඇත.

රෙගුලාසි පැනවීමට ඇති බලය

**16.** (1) සභාව මෙම පනත යටතේ සහ මෙම පනත මගින් අවශ්‍ය කර තිබෙන හෝ බලය දී තිබෙන යම් කරුණක් සම්බන්ධයෙන් නිර්දේශ කිරීම සඳහා හෝ මෙම පනත යටතේ එහි බලතල, ක්‍රියාකාරකම් හෝ වගකීම් හා සම්බන්ධ හෝ ඒ පිළිබඳව

හෝ එය විධිමත්ව ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හෝ පිළිපැදීම ආදිය සම්බන්ධයෙන් රෙගුලාසි පනවනු ඇත.

(2) උපවගන්ති (1) හි විධිවිධානවල සාමාන්‍ය තත්ත්වයට හානියක් නොවන ආකාරයෙන් පහත සඳහන් සියලු හෝ කරුණක් සම්බන්ධයෙන් සභාව රෙගුලාසි පනවයි:—

(අ) සභාවේ රැස්වීම් කැඳවා එය පැවැත්වීම, එකී රැස්වීම් පවත්වනු ලබන වේලාව, ස්ථානය සහ එහි සාකච්ඡා කිරීමට නියමිත කරුණ;

(ආ) ආයතනයේ සහ සභාවේ දේපළ කළමනාකරණය කිරීම, එහි අරමුදල ආරක්ෂා කිරීම සහ එහි ගිණුම් පවත්වාගෙන යාම සහ එය විගණනය කිරීම;

(ඇ) ස්ථිර සහ වෙනත් කමිටු සභාව විසින් තෝරා ගැනීම හෝ පත්කිරීම, එකී කමිටුවල බලතල, ක්‍රියාකාරකම් සහ වගකීම්, එම බලතල පාවිච්චි කිරීමේ දී යටත්විය යුතු කොන්දේසි සහ ඉටුකළ යුතු හෝ විමධ්‍යගත කළ යුතු කොන්දේසි;

(ඈ) සභාවේ නිලධාරීන්ගේ බලතල, ක්‍රියාකාරකම් සහ වගකීම් සහ වැටුප්, ගාස්තු, ගෙවීම් සහ එකී නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවා කොන්දේසි;

(ඉ) සභාවේ නිලධරයන් සහ සේවකයන් පිළිබඳ විනය කටයුතු ක්‍රියාත්මක කිරීම;

(ඊ) බඳවා ගැනීමේ දී ගෙවීම් කළයුතු ආකාරය සහ වේලාව, ලියාපදිංචි සහ අලුත්කිරීමේ ගාස්තු, අලුත් කිරීමේ ගාස්තු ගෙවීමට අපොහොසත් වුවහොත් සාමාජිකත්වය අත්හිටුවීම සහ එවන් සාමාජිකත්වය අලුත් කිරීම සඳහා වූ කොන්දේසි;

(උ) වෘත්තීය අවකල්ක්‍රියාව වශයෙන් සැලකෙන කරුණු සඳහන් කිරීම;

(ඌ) විනය කමිටු ස්ථාපිත කිරීමේ ක්‍රම;

(එ) විනය කමිටුවක් පරීක්ෂණ කළ යුතු ආකාරය;

(ඒ) සුදුසුකම් ලැබීමේ විභාග සඳහා ඇතුල් කරනු ලබන ශිෂ්‍යයන් විසින් ගෙවිය යුතු ගාස්තු හෝ ආයතනය විසින් ලබාදෙනු ලබන මාර්ගෝපදේශ පාඨමාලා යනාදිය සඳහා ගෙවිය යුතු ගාස්තු සහ දේශකයන්ගේ සහ විභාග පරීක්ෂකවරුන්ගේ සේවය ලබාගැනීම සහ ඔවුන්ගේ ගාස්තු ; සහ

(ඔ) ශිෂ්‍ය ප්‍රජාවට මූල්‍යමය හෝ වෙනත් ආකාරයේ සහයෝග ලබා දීම.

**17.** (1) සභාපති විසින් සභාව සමග සාකච්ඡා කර සභාවේ නිල කාලය සඳහා උපදේශකයන් වශයෙන් සාමාජිකයන් සිව් (4) දෙනෙක් සභාවට පත් කළ යුතු ය. උපදේශක මණ්ඩලය

(2) මෙම සාමාජිකයන් සිවු දෙනා සභාව සඳහා වූ උපදේශක මණ්ඩලයක් වශයෙන් සලකනු ලබන අතර, සභාවට උපදෙස් ලබාදිය යුතු ය.

(3) උපදේශක සභාවට නම් කරනු ලබන සාමාජිකයන් රක්ෂණ ක්ෂේත්‍රයේ හෝ එවැනි වෙනත් අංශවල කැපී පෙනෙන පුද්ගලයන් විය යුතු අතර, එහි එක් සාමාජිකයකු එක්සත් රාජධානියේ වරලත් රක්ෂණ ආයතනය විසින් පත්වීම සඳහා නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(4) උපදේශක සභාව හෝ එහි සාමාජිකයන් සභාවේ කැඳවීම මත සභා රැස්වීම්වලට සහභාගීවිය හැකි නමුත් එහි දී ඡන්දය ප්‍රකාශය කිරීමේ අයිතිය ඔවුන්ට නොමැත.

(5) උපදේශක සභාවේ සාමාජිකයකුගේ නිල කාලය සභාවේ නිල කාලය වන අතර, නැවත තෝරා පත්කරගැනීම සඳහා ඔවුන් සුදුසුකම් ලබයි.

(6) උපදේශක සභාවේ එක් සාමාජිකයෙක් සභාවේ බහුතරයකගේ තීරණය අනුව පමණක් ඉවත් කරනු ලැබිය හැකි ය.

**18.** (1) කිසිම පුද්ගලයෙක් පහත සඳහන් තත්ත්වයන් යටතේ ආයතනයේ සාමාජිකයෙක් වශයෙන් බඳවා නොගත යුතු ය:— සාමාන්‍ය සුදුසුකම්.

(අ) ඔහු/ඇය වයස අවුරුදු දහ අට (18) සම්පූර්ණ කර නොතිබුණහොත් සහ ශ්‍රී ලාංකිකයකු නොවුණහොත්;

කෙසේ වුව ද, සභාව එහි තනි අභිමතය අනුව ශ්‍රී ලංකාවේ ස්ථිරව වෙසෙන පුද්ගලයකුට ඔහු ශ්‍රී ලංකා පුරවැසියකු නොවූවද ඔහු ප්‍රසිද්ධ පුද්ගලයකු වශයෙන් සළකනු ලබන්නේ නම් ඔහුට සාමාජිකත්වය ලබාදිය හැකි ය;

(ආ) නිසි බලය ඇති උසාවියක් මගින් සිහිවිකල් වූ පුද්ගලයෙක් වශයෙන් තීන්දු කර තිබුණහොත්;

(ඇ) වස්තුභංගත්වයට පැමිණි හෝ බංකොලොත්භාවයට පත්වූ පුද්ගලයෙක් වශයෙන් තීන්දු කර තිබුණහොත්, ඔහු වස්තු භංගත්වයට පැමිණ ඇත්තේ හෝ බංකොලොත්භාවයට පත්වී ඇත්තේ සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් වැළැක්විය නොහැකි අලාභයක් හේතුකොටගෙන යන්න හෝ දුර්භාග්‍යයක් හේතුකොටගෙන යන්න තහවුරු කිරීමේ සහතිකයක් නිසි බලය ඇති උසාවියක් මගින් ලබාදී නොතිබුණහොත්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක නිසි බලය ඇති උසාවියක් මගින් සිරගතකර හෝ ඒ හා සමාන දඬුවමක් මගින් දඬුවම් ලබාදිය හැකි සදචාරාත්මක දුරාචාරයක් සම්බන්ධ වූ වරදකට දඬුවම්කර තිබුණහොත් සහ ස්වෛරී ක්ෂමාවක් ලබා දී නොතිබුණහොත්;

(2) මෙම කොටසේ (ආ) හෝ (ඇ) හෝ (ඈ) වගන්තිවල සඳහන් කර ඇති නුසුදුසුකම්වලට යටත්වී තිබුණහොත් ආයතනයේ සාමාජිකයෙක් වන ඕනෑම අයෙක් සභාව විසින් ඉවත් කළ යුතු ය:

එසේ වුවද, එවැනි අස්කිරීමකින් අනතුරුව යම් අවස්ථාවක දී ඔහු/ඇය නැවත බඳවාගැනීමට සුදුසුකම් ඇතැයි සැහීමට පත්විය හැකි අවස්ථාවක දී එකී පුද්ගලයා නැවත බඳවාගැනීමට හැකියාවක් ඇත.

**වෘත්තීය අවකල්ක්‍රියාව හේතුවෙන් සාමාජිකත්වය අවලංගු කිරීම**

**19.** (1) ආයතනයේ සාමාජිකත්වය දරන පුද්ගලයෙක් ඔහු වෘත්තීය අවකල්ක්‍රියාව හේතුවෙන් වරදකරුවෙක් වී ඇති හේතුව නිසා රක්ෂණ ක්ෂේත්‍රයේ සේවයට බඳවාගැනීමට හෝ සම්බන්ධවීමට හෝ අයෝග්‍ය පුද්ගලයෙක් වන බවට සභාව සලකන්නේනම්, සභාවට ඔහුගේ /ඇයගේ සාමාජිකත්වය අවලංගු කළ හැකි ය.

(2) "වෘත්තීය අවකල්ක්‍රියාව" යන්නෙහි තේරුම් මෙහි උපලේඛනයේ සඳහන් කර ඇත.

(3) උප වගන්ති (1) යටතේ සාමාජිකත්වය අහිමි කිරීම තුළින් පසු අවස්ථාවක දී ඔහු පිළිබඳව සෑහීමට පත්වුවහොත් එකී පුද්ගලයා නැවත බඳවාගැනීමට සභාවට බාධාවක් ඇති නොවන්නේ ය.

**විනය කමිටුවක් මගින් පවත්වනු ලබන පරීක්ෂණ**

**20.** (1) විනය කමිටුවක් මගින් පරීක්ෂණයක් සිදුකිරීමෙන් අනතුරුව යම් පුද්ගලයෙක් වෘත්තීය අවකල්ක්‍රියාවක් නිසා වැරදිකරු කර තිබෙන බවට සභාවට වාර්තාවක් ඉදිරිපත් කර තිබුණහොත් මිස (18) හෝ (19) වෙනි වගන්ති යටතේ පුද්ගලයකුගේ සාමාජිකත්වය සභාව විසින් අවලංගු නොකළ යුත්තේ ය.

(2) පැමිණිල්ලක් හේතුවෙන් හෝ වෙනත් හේතුවක් නිසා ආයතනයේ සාමාජිකත්වය දරන පුද්ගලයකු වෘත්තීය අවකල්ක්‍රියාවක් නිසා වැරදිකරු කර තිබෙන බව විශ්වාස කිරීමට තරම් සභාවට සාධාරණ හේතුවක් තිබේනම් එකී පුද්ගලයාගේ හැසිරීම් පිළිබඳව පරීක්ෂණයක් සිදුකිරීමේ අරමුණෙන් සභාව විනය කමිටුවක් පත් කළ හැකි ය.

(3) මෙම වගන්තිය යටතේ පත්කර ඇති විනය කමිටුව විසින් පිළිපැදිය යුතු ව්‍යවස්ථා සහ ක්‍රියාපටිපාටි සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු විධිවිධාන, එකී කමිටුව මගින් පවත්වනු ලබන පරීක්ෂණවලදී යොදගනු ලබන බලතල යනාදිය සභාව විසින් නිර්දේශ කළ යුත්තේ ය.

**සාමාජිකත්වය අවලංගු කිරීම වෙනුවට අත්හිටුවීම**

**21.** (18) හෝ (19) වෙනි වගන්තිවලට යටත්ව ආයතනයේ සාමාජිකත්වයෙන් පුද්ගලයකු ඉවත් කිරීම සඳහා සභාවට බලය ලබා දී ඇති අවස්ථාවක දී එම බලතල ක්‍රියාත්මක කිරීම වෙනුවට සභාව සුදුසුයැයි සිතන යම් කාලසීමාවකට එකී සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටුවිය හැකි ය.

සභාවේ තීරණයකට එරෙහිව ඇපෑල් මණ්ඩලයකට පැමිණිලි කිරීම

**22.** (1) සභාවේ තීරණයක් නිසා පීඩාවට පත් වූ පුද්ගලයකු එම අරමුණ සඳහා පිහිටුවා ඇති ඇපෑල මණ්ඩලයකට පැමිණිලි කළ හැකි ය —

(අ) ඇපෑල මණ්ඩලයට රක්ෂණ ක්ෂේත්‍රයේ වසර පහකට (5) වැඩි කළමනාකරණ හෝ ඊට ඉහළ තනතුරක සේවය කර ඇති අවම වශයෙන් පහළොස් (15) වසරක පළපුරුද්දක් ඇති තිදෙනෙකු (3) විනිශ්චයකරුවන් වශයෙන් පත්කර තිබිය යුතු ය;

(ආ) ඉහත (අ) වෙනි වගන්තියට යටත් ව සභාවට සහ පීඩාවට පත් පාර්ශ්වයට තමතමන් නියෝජනය කරන එක් විනිශ්චයකරුවෙක් පත්කිරීමේ බලය ඇත්තේ ය;

(ඇ) එසේ පත්කරන ලද විනිශ්චයකරුවන් ඇපෑල මණ්ඩලයේ තෙවැනි සහ ප්‍රධාන විනිශ්චයකරු පත් කරගත යුතු ය;

(ඈ) ඇපෑල මණ්ඩලය විසින් පිළිපැදිය යුතු නියමයන් එකී ඇපෑල මණ්ඩලය විසින් තීරණය කර නිශ්චය කරගත යුතු ය.

(2) ඇපෑල මණ්ඩලයේ තීන්දුවක් නිසා පීඩාවට පත් පුද්ගලයකු එකී තීන්දුවට එරෙහිව ශ්‍රී ලංකාවේ ඇපෑල උසාවියකට පැමිණිලි කළ හැකි ය.

(3) උපවගන්ති (2) යටතේ වූ තීන්දුවකට එරෙහි සෑම ඇපෑලක්ම —

(අ) ලිඛිත පෙත්සමක් මගින් ඉදිරිපත් කළ යුතු ය;

(ආ) එම තීන්දුව ලබා දී දින හතලිස් දෙකක් (42) ඇතුළත ඉදිරිපත් කළ යුතු ය; සහ

(ඇ) එවන් ලදු විභාගයකින් අනතුරුව ඇපෑල උසාවියක විනිසුරුවරයෙක් විසින් එය විභාග කර තීන්දුවක් ලබා දිය යුතු ය.

මෙම පනත සඳහා වන සංශෝධන

**23.** මෙම පනත සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර මහා සභා රැස්වීමකට සහභාගිවන සාමාන්‍ය සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට වැඩි ඡන්දයෙන් එය සම්මත විය යුතු ය:

එසේ වුවද, සංශෝධනයක් පිළිබඳ යෝජනාවක් එවන් රැස්වීමකට ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජනාව පිළිබඳ ලිඛිත දැනුම්දීමක් එයට දින දහතරකට (14) පෙර සෑම සාමාන්‍ය සාමාජිකයන්ටත් යැවිය යුතු ය.

වාරණ

**24.** ආයතනය පහත සඳහන් කර ඇති යම් ක්‍රියාවකට සම්බන්ධ නොවනු ඇත:—

(1) ආයතනය එහි සාමාජිකයන්හට මුල්‍යමය ආදායම් හෝ ලාභ ලබාගැනීමේ අරමුණෙන් යම් වෙළඳමක් හෝ ව්‍යාපාරයක නිරත නොවනු ඇත. නොඑසේනම්, යම් ගනුදෙනුවකට සම්බන්ධ නොවනු ඇත.කිසිම සාමාජිකයකුට ආයතනයෙහි කිසිම දේපළක් සම්බන්ධයෙන් පෞද්ගලික අයිතිවාසිකමක් නොමැත්තේ ය. නොඑසේනම්, ආයතනයේ වැටුප් ලබන සේවකයෙක් වශයෙන් සිටින අවස්ථාවන් හැර සාමාජිකත්වය හේතුවෙන් කිසිම ලාභයක් ලබා නොගත යුතු ය;

(2) සභාව ව්‍යාපාරයක් හෝ මිලගණන් පිළිබඳව සීමා පැනවීමට උත්සාහ දැරීමට හෝ වෙනත් යම් ආකාරයට අතපොවන්නට හෝ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට අවතීර්ණ නොවනු ඇත;

(3) ආයතනය යම් දේශපාලන පක්ෂයකට සහභාගිවීම හෝ එහි මුදල් හෝ දේපළක් දේශපාලන අරමුණු සඳහා පාවිච්චි කිරීම සිදු නොකරනු ඇත;

(4) ආයතනයේ පරිශ්‍රය තුළදී කිසිම ආකාරයක සූදු කෙළීම් තහනම් කර ඇත;

(5) ආයතනයේ අරමුදල් උසාවියකින් වැරදිකරු කර ඇති සාමාජිකයන්ගේ දඩමුදල් ගෙවීමට යොදා නොගත යුත්තේ ය;

නිලධාරීන්ගේ වන්දි

**25.** (1) සේවකයන් ඔවුන්ගේ රාජකාරි ඉටුකිරීම නිසා ඔවුන්ට එරෙහි යම් හිමිකමක් ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් මුහුණ දුන් සියලු අලාභවලට වන්දි ගෙවනු ලැබේ. ඉහත කී අලාභය ඔවුන්ගේ හිතාමතා හැසිරීම හේතුවෙන් හෝ ඔවුන්ගේ වැරදි හේතුවෙන් සිදුවී ඇත්නම් මෙට අදාළ නොවේ.

(2) සභාවේ සාමාජිකයකු හෝ වෙනත් නිලධාරියකු සභාවේ තවත් සාමාජිකයකුට හෝ නිලධාරියකුට කිසිවක් බැඳී නොමැති අතර යම් ක්‍රියාවකට හෝ යම් ලැබීමක දී එක්වීමට හෝ යම් ක්‍රියාවකට එකඟ වීමට හෝ ආයතනයට ඇතිවන යම් අලාභයක දී කොටස්කරුවකුවීමට හෝ බැඳී නොමැත. මෙය ඔහුගේ හිතාමතා හැසිරීම හේතුවෙන් හෝ වැරදී හේතුවෙන් සිදුවී ඇත්නම් අදාළ නොවේ.

වන්දි සහ දඩ මුදල්

**26.** (1) මෙම පනතේ විධිවිධානවලට පටහැනිව හැසිරෙන පුද්ගලයකු මෙම පනත යටතේ වැරැද්දකට වැරදිකරුවෙක් වන අතර මහෙස්ත්‍රාත්වරයෙක් ඉදිරියේ පවත්වන ලද ලඝු විභාගයකින් අනතුරුව වැරදිකරු යැයි තීන්දු කරනු ලැබුවහොත් මෙම පනත යටතේ නිර්දේශ කර ඇති දඩමුදලට යටත්වනු ඇත.

(2) මෙම පනත යටතේ යම් වැරැද්දකට සභා සාමාජිකයකුට හෝ නිලධාරියකුට සභාව විසින් එකී අරමුණ සඳහා ලිඛිතව අනුමැතිය ලබා දී තිබුණහොත් මිස නඩු පැවරිය නොහැකි ය.

විසුරුවා හැරීම

**27.** දැනට ශ්‍රී ලංකාවේ වාසය කරන ආයතනයේ පහෙන් තුනක් වන සංඛ්‍යාවට නොඅඩු සාමාන්‍ය සාමාජිකයන් ඍජුව හෝ විධිමත්ව පත්කර ඇති නීතිඥයකු මාර්ගයෙන් සභාව විසුරුවාහැරීමේ අරමුණ සඳහා රැස්කරන ලද මහා සභා රැස්වීමක දී එකඟත්වය ප්‍රකාශ කර තිබුණහොත් මිස ආයතනය විසුරුවා නොහැරිය යුත්තේ ය. ඉහත කී ආකාරයට ආයතනය විසුරුවා හරිනු ලැබුවහොත් ආයතනය වෙනුවෙන් නීත්‍යානුකූලව ලබාගෙන ඇති සියලු ණය සහ වගකීම් සම්පූර්ණයෙන් ගෙවා නිමකළ යුතු අතර, ඉතිරිවන අරමුදල සම්බන්ධයෙන් එකී මහා සභා රැස්වීමේ දී නිර්දේශ කර ඇති පරිදි කටයුතු කළ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

උපලේඛනය

**ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයන්හි නියමයන්**

**සාමාජිකත්වය**

1\. යම් පුද්ගලයකු ආයතනයෙහි සාමාන්‍ය සාමාජිකත්වය ලබාගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටි පහත සඳහන් වේ:— සාමාන්‍ය සාමාජිකත්වය සඳහා අයදුම් කරන ආකාරය.

(i) ආයතනයෙහි සාමාන්‍ය සාමාජිකත්වය ලබාගැනීමට අදහස් කරන කෙනෙක් සභාව විසින් නියම කරනු ලබන ආකාරයේ අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර සභාව විසින් නියම කරනු ලබන අවශ්‍ය ලිපිලේඛන සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය;

(ii) එකී අයදුම්පත ආයතනයෙහි සාමාන්‍ය සාමාජිකයන් දෙදෙනෙක් විසින් යෝජනා කර සම්මත කර තිබිය යුතු ය; සහ

(iii) එම අයදුම්පත රෙගුලාසි මගින් නියම කර ඇති ආකාරයට සභාව විසින් පිළිගත යුතු ය.

2\. යම් පුද්ගලයකු ආයතනයෙහි ලියාපදිංචි සාමාජිකත්වය ලබාගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටිය පහත සඳහන් වේ:— ලියාපදිංචි සාමාජිකත්වය සඳහා අයදුම් කරන ආකාරය.

(i) ආයතනයෙහි ලියාපදිංචි සාමාජිකත්වය ලබාගැනීමට අදහස් කරන කෙනෙක් සභාව විසින් නියම කරනු ලබන ආකාරයේ අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, සභාව විසින් නියම කරනු ලබන අවශ්‍ය ලිපිලේඛන සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය;

(ii) එම අයදුම්පත ආයතනයෙහි සාමාන්‍ය සාමාජිකයකු විසින් අනුමත කළ යුතු ය; සහ

(iii) එම අයදුම්පත සභාව විසින් නියම කර ඇති ආකාරයට ආයතනයෙහි ප්‍රධාන විධායක නිලධාරි විසින් පිළිගත යුතු ය.

ආයතනයෙහි සාමාජිකත්වය සඳහා ගෙවන ගාස්තුව.

3. (1) ශ්‍රී ලංකා රක්ෂණ ආයතන පනතෙහි 19 සහ 20 වෙනි වගන්තිවල විධිවිධානයන්ට යටත්ව ආයතනයෙහි සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබන කෙනෙක් වරින්වර රෙගුලාසි මගින් නිර්ණය කරනු ලබන ගාස්තුව සභාවට ගෙවීම මගින් බඳවාගනු ලැබේ.

(2) එකී ගාස්තුව සහ ආයතනයට අයවිය යුතු අනෙකුත් ගාස්තු වරින්වර සභාව විසින් නියම කරනු ලබන පරිදි සභාවට හෝ සභාව සංස්ථාපනය කර නොමැතිනම් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට ගෙවිය යුතු ය. සභාව සංස්ථාපනය කරනු ලබන තෙක් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් එකී මුදල තම භාරයේ තබා ගනු ඇත.

(3) ආයතනයෙහි සාමාජිකයකු වශයෙන් බඳවාගනු ලැබූ කෙනකුගේ සාමාජිකත්වය එසේ බඳවාගනු ලැබීමෙන් පසුව එළඹෙන වර්ෂයේ ජනවාරි පළමුවන දින තෙක් වලංගුවේ. සෑම අලුත් කිරීමකදී ම නිශ්චය කරනු ලබන ගාස්තුව සභාවට ගෙවීම මගින් සාමාජිකත්වය අලුත් කරනු ලැබිය හැකි ය.

(4) රෙගුලාසි මගින් වරින්වර සභාව විසින් නිශ්චය කරනු ලබන වාර්ෂික ගාස්තුව ජනවාරි පළමුවන දින සිට මාස දෙකක් ඇතුළත ගෙවිය යුතු ය.

(5) ඉහත සඳහන් කර ඇති පරිදි වාර්ෂික ගාස්තු ගෙවීමට කෙනෙක් අපොහොසත් වුවහොත් එකී සාමාජිකයාගේ සාමාජිකත්වය අප්‍රාණික වනු ඇත.

(6) මෙම නියමයට අනුව අප්‍රාණික වූ සාමාජිකයෙක් සභාව විසින් වරින්වර නියම කරනු ලබන අනෙකුත් ගාස්තු ද සමග වාර්ෂික ගාස්තුව ගෙවීම මගින් නැවත ලියාපදිංචි කරගත හැකි ය.

### සභාව

සභාවෙහි සාමාජිකයන් තෝරා පත් කර ගැනීම.

4. (1) සභාවෙහි සාමාජිකයන් සෑම වාර්ෂික රැස්වීමකදීම තෝරා පත්කර ගත යුතුවේ.

(2) සභාවෙහි තනතුරක් දැරීමට අදහස් කරනු ලබන සහ ඡන්ද විමසීමට සහභාගිවීමට කැමති සාමාජිකයන් ප්‍රධාන විධායක නිලධාරි

වෙත හෝ ඔහු නොමැතිනම් එකී අරමුණ සඳහා සභාව විසින් බලය ලබාදී ඇති අය වෙත නම් කර ඇති සාමාජිකයාගේ ලිඛිත එකඟතාවයද සමග වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්වීමේ දිනට දින හතකට (7) පෙර සාමාන්‍ය සාමාජිකයන් දෙදෙනෙක් විසින් යෝජනා කර සම්මත කර තිබිය යුතු ය.

(3) මෙම නියමය යටතේ ඉදිරිපත් කර ඇති අයදුම්පතක් සහභාගි වී සිටින සාමාන්‍ය සාමාජිකයන්ගේ වැඩි ඡන්ද මත එක් එක් තනතුරු සඳහා පවත්වනු ලබන වාර්ෂික මහ සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතු ය.

සභාවට තෝරා පත් කර ගැනීම සඳහා සුදුසුකම්.

5. (1) සභාවට තෝරා පත්කරනු ලබන සාමාජිකයන්ගේ සුදුසුකම් පහත සඳහන් වේ:—

(අ) සභාවට තෝරා පත්කර ගැනීමට සුදුසුකම් තිබෙන්නේ ආයතනයේ සාමාන්‍ය සාමාජිකයන්ට පමණයි;

(ආ) මෙයට පෙර සභාවේ තනතුරක් නොදැරූ සාමාන්‍ය සාමාජිකයකු සම සභා සාමාජික තනතුර හැර වෙනත් තනතුරකට තෝරා පත්කර ගැනීමට සුදුසුකම් නොලබයි;

(ඇ) අවම වශයෙන් වාර දෙකක් සභාවේ සාමාජිකත්වය නොදැරූ සාමාන්‍ය සාමාජිකයකු සභාවේ සභාපති වශයෙන් හෝ උප සභාපති වශයෙන් හෝ ලේකම් වශයෙන් තෝරා පත්කර ගැනීමට සුදුසුකම් නොලබයි;

(ඈ) වරලත් රක්ෂකයෙක්, වරලත් රක්ෂණ මෙහෙයුම්කරුවෙක් හෝ වරලත් තැරැව්කරුවෙක් හෝ එක්සත් රාජධානියෙහි වරලත් රක්ෂණ ආයතනය විසින් ප්‍රදානය කරනු ලබන ඒ හා සමාන සුදුසුකමක් නොමැති සාමාන්‍ය සාමාජිකයකු සභාපති වශයෙන් තෝරා පත්කර ගැනීමට සුදුසුකම් නොලබයි;

(ඉ) නිල කාලය අවසන්වීමත් සමග තනතුරෙන් ඉවත්වී යන ගරු භාණ්ඩාගාරික තනතුර දැරූ සාමාජිකයකු හැර වෙනත් සාමාජිකයකු සභාවේ සාමාජිකයකු වශයෙන් මීළඟ ධුර කාලය සඳහා නැවත තෝරා පත්කරනු ලැබිය හැකි ය; සහ

(ඊ) අඛණ්ඩව වාර දෙකකට වඩා වැඩි කාලසීමාවක් සභාවේ සභාපති ධුරය දැරීමට කිසිවෙක් සුදුසුකම් නොලබයි.

(2) මෙම නියමයන්ට ශ්‍රී ලංකා රක්ෂණ ආයතන පනතෙහි යම් රෙගුලාසිවලට පටහැනි වුව ද ඒ පිළිබඳව නොසලකා එක් තනි ආයතනයක සාමාජිකයන් දෙදෙනකුට වඩා වැඩි සංඛ්‍යාවක් සභාවට තෝරා පත් නොකරගත යුතු ය.

(3) සභාවේ හිටපු සභාපති නිලබලයෙන් ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම අවසන් වනතෙක් සාමාජිකයකු වශයෙන් සිටිනු ඇත. එහෙත් ඔහුට සභාවේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නොමැත. එකී සාමාජිකයා දෙවන වරටත් සභාවේ සභාපති වශයෙන් නැවත තෝරා පත්කරගනු ලැබුවහොත් ඉහත කී තනතුර දැරූ සභාවේ හිටපු සභාපති එපරිද්දෙන්ම සාමාජිකයෙක්ව සිටිනු ඇත.

6. සභාවේ සෑම සාමාජිකයකුම ඔහු/ඇය තනතුරෙන් අස් නොවී සිටියහොත් ඔහු/ඇය තේරී පත් වූ වාර්ෂික මහා සභා රැස්වීම අවසන් වූ දිනෙන් ආරම්භ වී ඊළඟ වර්ෂයේ මහා සභා රැස්වීම දක්වා තනතුර හොබවයි. සභා සාමාජිකයන්ගේ නිල කාලය.

7. සභා රැස්වීම්— සභාවෙහි ක්‍රියා පටිපාටි.

(i) සභාව මසකට වරක් වරින් වර තීරණය කරනු ලබන ස්ථානයක දී රැස්වේ;

(ii) සභා රැස්වීම්වලට සභාපති මුලසුන හෙබවිය යුතු අතර, ඔහු නොමැති අවස්ථාවක දී උප සභාපති හෝ ඔහුද නොමැති වුවහොත් සහභාගි වී සිටින අය අතරින් සභාපති කෙනෙක් තෝරා පත්කරගනු ලැබේ;

(iii) මෙහි මින්මතු විස්තර කරනු ලබන පරිදි සභාවේ ප්‍රධාන විධායක නිලධාරි සභා රැස්වීම්වලට සහභාගි වන අතර, යම් හේතුවක් නිසා ප්‍රධාන විධායක නිලධාරිට සහභාගි විය නොහැකි වුවහොත් සභාවේ නිලධාරියෙක් ප්‍රධාන විධායක නිලධාරි තැන නියෝජනය කරනු ඇත. ඉහත කී නිලධාරියා සභාවේ ආරාධනයට අනුව එම රැස්වීම්වල දී තම යුතුකම් ඉටු කරනු ඇත.

**රැස්වීම් පිළිබඳ දැනුම් දීම.**

8. (1) සභා රැස්වීමක් ඕනෑම අවස්ථාවක දී පහත සඳහන් පුද්ගලයන් විසින් කැඳවනු ලැබිය හැකි ය.

(අ) සභාපතිගේ නියෝගය පරිදි; හෝ

(ආ) ඔහු නොමැතිනම් උප සභාපති විසින්; හෝ

(ඇ) අවම වශයෙන් සභාවේ සාමාජිකයන් දෙදෙනකුගේ ලිඛිත ඉල්ලීම මත,

ඉහත ඉල්ලීම ගරු ලේකම් වෙත හැකිනම් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන විෂයයන් ලැයිස්තුවක් සහ/හෝ ගැනීමට නියමිත පියවර සහ/හෝ කරුණු පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු ය:

එසේ වුව ද, හදිසි අවස්ථාවක දී මෙම උපවගන්තියට අනුව නියෝගය හෝ ඉල්ලීම ඒ ආකාරයටම සඳහන් කළ යුතු අතර, හදිසි අවශ්‍යතාවයෙහි හේතුව/හේතුන් විස්තර කෙරෙන ප්‍රකාශයක් ද ඇතුළත් විය යුතු ය.

(2) සභා රැස්වීමක දී සාකච්ඡා කළ යුතු කරුණක් හෝ ගැනීමට නියමිත පියවරක් සහ/හෝ ඉදිරිපත් කළ යුතු විෂයයක් පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කිරීමට අදහස් කරනු ලබන්නේ නම් ඊළඟ රැස්වීමේ දී එය සාකච්ඡාවට ලක්කළ යුතු යයි ඉල්ලා සිටිනු ලබන ලිඛිත ඉල්ලීම ගරු ලේකම් වෙත භාරදිය යුතු ය.

(3) ඉහත උපවගන්ති (1) ට අනුව නියෝගයක් හෝ ඉල්ලීමක් ලද වහාම අපේක්ෂිත රැස්වීම පවත්වනු ලබන දිනය, වේලාව සහ ස්ථානය යනාදිය සඳහන් කර සභාවේ සෑම සාමාජිකයකුටම දින හතක (7) දැනුම්දීමක් හෝ හදිසි අවස්ථාවක් නම් දින තුනක (3) දැනුම්දීමක් ගරු ලේකම් විසින් ලබාදිය යුතු ය.

(4) ගරු ලේකම් විසින් ඉහත උපවගන්ති (3) ප්‍රකාරව ලබාදෙනු ලබන යම් දැනුම්දීමක් වේ නම්, ඒ සමග පහත සඳහන් කරුණු ද ඉදිරිපත් කළ යුතු වේ:—

(අ) එකී රැස්වීමේ දී සාකච්ඡා කළ යුතු සියලු විෂයයන් පිළිබඳ ලැයිස්තුවක්; සහ

(ආ) ඔහු වෙත ලැබුණු හදිසි රැස්වීම කැඳවීම සඳහා වූ හේතුව විස්තර කරන ප්‍රකාශයක්.

(5) රැස්වීම පිළිබඳ දැන්වීමක් ලැබීමට සුදුසුකම් ඇති සභා සාමාජිකයන් සියලු දෙනාම තමන්ට දැන්වීමක් නොලැබීම පිළිබඳව විරෝධයක් නොපා රැස්වීමට සහභාගි වුවහොත් හෝ රැස්වීම පිළිබඳ දැන්වීමක් ලැබීමට සුදුසුකම් ඇති සභා සාමාජිකයන් සියලු දෙනාම ඡන්දය ප්‍රකාශ කිරීමට එකඟ වන්නේ නම් රැස්වීම පිළිබඳ දැන්වීමේ දී සිදු වී ඇති දෝෂ නොසලකා හරිනු ලැබේ.

සභා රැස්වීම සඳහා ගණපූරණය.

9. (1) ගණපූරණයක් නොමැතිනම් සභා රැස්වීමක දී කිසිම විෂයයක් පිළිබඳව සාකච්ඡා නොකළ යුතු ය.

(2) අවම වශයෙන් සභා සාමාජිකයන් හය (6) දෙනෙක් පැමිණ සිටියහොත් සභා රැස්වීමක් සඳහා ගණපූරණයක් ඇති බවට සලකනු ලැබේ.

(3) සභා රැස්වීමක් පැවැත්වීමට නියමිත වේලාවේ සිට මිනිත්තු තිහක් (30) ඇතුළත ගණපූරණයක් දක්නට නොලැබුණහොත් එකී රැස්වීම ඊළඟ සතියේ එම දිනයේ එම වේලාවටම එම ස්ථානයේදීම නැවත පැවැත්වීම සඳහා කල් දැමිය යුතු ය. නොඑසේ නම්, සභාපති විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් දිනයකට, වේලාවකට, ස්ථානයකට කල්දැමිය හැකි ය. එම කල්දැමීම් පිළිබඳව අවම වශයෙන් දින තුනක (3) දැනුම්දීමක් සභා සාමාජිකයන් සියලු දෙනාටම ලබාදිය යුතු ය.

රැස්වීම පවත්වන ආකාරය.

10. සභාවෙහි රැස්වීමක් පහත සඳහන් එක් ආකාරයට පවත්වනු ලැබිය හැකි ය:—

(i) රැස්වීම සඳහා නිශ්චය කර ඇති ස්ථානයක, දිනයක සහ වේලාවක දී ගණපූරණයක් නිර්මාණය කළ හැකි සභා සාමාජිකයන් එක්රැස්වීම මගින්; හෝ

(ii) ශ්‍රව්‍ය, දෘෂ්‍ය සන්නිවේදන පහසුකම් සහිතව රැස්වීමේ දී සාකච්ඡාවට බඳුන්වීමට නියමිත කරුණු පිළිබඳව සවිස්තරාත්මක වැඩසටහනක් ද සමගින් එකී කරුණු

පිළිබඳව අදාළ ලිපිලේඛන සියල්ල ඉදිරිපත් කර රැස්වීම පැවැත්වීමට නියමිත වේලාව පිළිබඳව ලිඛිතව දැනුම්දී සහභාගිවන සියලු දෙනා එකම අවස්ථාවක දී සවන්දිය හැකි ආකාරයේ ශ්‍රව්‍ය, දෘෂ්‍යමය මාධ්‍යයක් මගින්.

ඡන්ද විමසීම.

11. සභා රැස්වීමේ දී සියලු තීරණ ගත යුත්තේ සභා සාමාජිකයන් අතර ගණනය කරනු ලබන ඡන්ද විමසීමකින් පසුවයි—

(i) සභාවේ සෑම සාමාජිකයකුට ම එක් ඡන්දයක් (1) හිමිවේ;

(ii) සභා රැස්වීමකට මුලසුන හොබවන සභාපති හෝ උපසභාපතිට එක් තීරක ඡන්දයක් හිමිවේ;

(iii) සහභාගි වී සිටින සියලු සභා සාමාජිකයන් ඒකමතිකව එකඟ වුවහොත් හෝ ඡන්ද බහුතරයක් ඒ වෙනුවෙන් ප්‍රකාශ කර තිබුණහොත් සභා යෝජනාවක් සම්මත වේ;

(iv) සාමාජිකයකු ප්‍රකාශිතව තම විරුද්ධත්වය ප්‍රකාශ කර රැස්වීමේ යෝජනාවකට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කර තිබුණහොත් මිස සභා රැස්වීමකට සහභාගි වී සිටින සාමාජිකයකු එකඟත්වය ප්‍රකාශ කර යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කර ඇතැයි සලකනු ලැබේ.

ලිඛිත යෝජනාව.

12. පහත සඳහන් ආකාරයට ලිඛිත යෝජනාවක් මගින් සභාවෙහි වැඩකටයුතු සිදුකළ යුතු වේ:—

(i) සභා සාමාජිකයන් බහුතරයකගේ අත්සනින් යුතුව හෝ එකඟත්වය ප්‍රකාශ කර ඇති ලිඛිත යෝජනාව විධිමත්ව කැඳවා පවත්වන ලද සභා රැස්වීමක දී සම්මත කර තිබුණහොත් එය වලංගු වන අතර ක්‍රියාත්මක කරනු ලැබේ;

(ii) එවන් තීරණයක් සමහර ලියවිලිවලින් සමන්විතවේ. (ෆැක්ස් හෝ ඒ හා සමාන සන්නිවේදන ලේඛන ඇතුළත්ව) එකී සෑම ලිපිලේඛනවල සභාවේ සාමාජිකයන් එක් අයෙක් හෝ ඊට වැඩි ගණනක් අත්සන් තබා එකඟතාවය ප්‍රකාශ කර තිබිය යුතු ය;

(iii) එවැනි යම් යෝජනාවක පිටපත් සභාවේ කාර්ය සටහන් පොතෙහි ඇතුළත් කර තිබිය යුතු ය.

සභා සාමාජිකයකුගේ නිල කාලය.

13. සභා සාමාජිකයකුගේ තනතුර පහත සඳහන් අවස්ථාවන්වල දී ශූන්‍ය වනු ඇත:—

(i) එකී සාමාජිකයා තම තනතුරෙන් ඉල්ලා අස්වන බව ලිඛිතව දැනුම් දී එක් (1) මාසයක් ඉකුත්වන අවස්ථාවේ දී; හෝ

(ii) දස දෙනකුට නොඅඩු සභාවේ සාමාජිකයන් සහභාගි වී සිටින එම අරමුණ සඳහා කැඳවනු ලැබූ විශේෂ සභා රැස්වීමක දී උක්ත සාමාජිකයා හැර සභාවේ තුනෙන් දෙකට නොඅඩු බහුතරයක් විසින් සම්මත වී ඇති උක්ත සාමාජිකයාගේ සාමාජිකත්වය ශූන්‍ය වන බවට තීරණය වුවහොත්—

(අ) සභාව විසින් නිවාඩු අනුමත නොකර අඛණ්ඩව සභා රැස්වීම් තුනකට (3) සහභාගි නොවුවහොත්;

(ආ) ඔහු/ඇය බංකොලොත් භාවට පත්වුවහොත් හෝ ගෙවීම් අත්හිටවනු ලැබුවහොත් හෝ ඔහුගේ ණයකරුවන් සඳහා ඔහුගේ බූදලය පවරනු ලැබුවහොත්;

(ඇ) ඔහු සිහිවිකල්භාවයට පත්වුවහොත්;

(ඈ) ඔහු/ඇය රක්ෂණ ක්ෂේත්‍රයේ කටයුතු කිරීම නවතා දැමුවහොත්; හෝ

(ඉ) ඔහුගේ ක්‍රියා කලාපය සභාව විසින් පිළිගත නොහැකි එකක් වුවහොත්.

තාවකාලික ඇබෑර්තු.

14. පහත සඳහන් තනතුරු සම්බන්ධයෙන් තාවකාලික ඇබෑර්තුවක් ඇතිවුවහොත්:—

(i) එය සභාවේ සභාපති ධුරය නම් ඉතිරි වී ඇති කාලසීමාව සඳහා උප සභාපති සභාපති ධුරය භාරගත යුතු ය;

(ii) එය උප සභාපති, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික, ගරු උපලේකම් ධුරය නම් සභාවේ බහුතරයකගේ ඡන්දයෙන් පත්කරන ලද සභාවේ සාමාජිකයකු ඉතිරිව ඇති කාලසීමාව සඳහා එම ධුරය දැරිය යුතු ය;

(iii) සභාවේ නිල කාලය තුළ සම සාමාජික ධුර පහක් (5) හෝ ඊට වැඩි සංඛ්‍යාවක් නම් සභාවේ සම්මුතියක් මගින් පත්කරන ලද ඒ හා සමාන සාමාන්‍ය සාමාජිකයන් ඉතිරිව ඇති කාලසීමාව සඳහා එම ඇබෑර්තු පිරවිය යුතු ය; හෝ

(iv) සභාවේ නිල කාලය තුල සභා සාමාජික ධුර අටක් (8) හෝ ඊට වැඩි නම් ඉතිරිව ඇති කාලසීමාව සඳහා තනතුරු හෙබවීමට සභාවක් තෝරා පත්කර ගැනීමට ආයතනයෙහි සාමාන්‍ය සාමාජිකයන්ගේ විශේෂ මහා සභා රැස්වීමක් ඉතිරිව ඇති සාමාජිකයන් විසින් කැඳවනු ලැබිය යුතු ය. එමෙන්ම තවත් නිල කාලයක් සුදුසු යැයි හැඟී ගියහොත් එවන් රැස්වීමක දී සාමාන්‍ය සාමාජිකයන් විසින් තවත් යෝජනාවකින් එය සම්මත කරගත යුතු ය.

### මහා සභා රැස්වීම්

වාර්ෂික මහා සභා රැස්වීම.

15. වාර්ෂික මහා සභා රැස්වීම:—

(i) සෑම වසරකම ජූනි මස තිස්වෙනිදට (30) පෙර වාර්ෂික මහා සභා රැස්වීම යැයි හඳුන්වනු ලබන ආයතනයේ සියලුම සාමාන්‍ය, යාවජීව සහ ගරු සාමාජිකයන්ට අවම වශයෙන් දින දහතරක (14) දැනුම්දීමක් කිරීමෙන් අනතුරුව සෑම වර්ෂයකදීම ආයතනයේ සමස්ථ සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් මහා සභා රැස්වීම පැවැත්විය යුතු ය;

(ii) සෑම වාර්ෂික මහා සභා රැස්වීමකදී ම පහත කරුණු සාකච්ඡා විය යුතු ය:-

(අ) (i) ඉකුත් වර්ෂයේ මහා සභා රැස්වීමෙහි වාර්තාව ඉදිරිපත් කර සම්මත කර ගැනීම;

(ii) විසිරී යන සභාවෙහි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර සම්මත කර ගැනීම;

(iii) ඉකුත් මුල්‍ය වර්ෂය සඳහා ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කර සම්මත කර ගැනීම;

(iv) එළඹෙන වර්ෂය සඳහා සභා සාමාජිකයන් තේරීම;

(v) එළඹෙන වර්ෂය සඳහා විගණන නිලධාරින් තේරීම; සහ/හෝ

(ආ) එකී රැස්වීම සඳහා වූ නිවේදනයෙහි නිවේදනය කර ඇති වෙනත් කටයුතු ඇත්නම් ඒ පිළිබඳව සාකච්ඡා කිරීම.

(iii) ඉහත දැනුම්දීමක් කර තිබීම හැර වෙනත් කරුණු වාර්ෂික මහා සභා රැස්වීමේ දී සාකච්ඡාවට බඳුන්විය යුතු යයි යම් සාමාජිකයෙක් අදහස් කරන්නේ නම් එම වර්ෂයේ ජූනි මස හත්වෙනි (7) දිනට පෙර ඒ පිළිබඳව ගරු ලේකම් දැනුවත් කළ යුතු ය.

16. විශේෂ මහා සභා රැස්වීමක් ඕනෑම මොහොතක සභාපති විසින් හෝ සභාවේ බහුතර ඡන්දයෙන් හෝ එවැනි රැස්වීමක් කැඳවන ලෙස සභාපතිට හෝ සභාපති වශයෙන් වැඩබලන පුද්ගලයකුට සාමාන්‍ය සාමාජිකයන් අතරින් අවම වශයෙන් හතරෙන් එක් කොටසක් ලිඛිත ඉල්ලීමක් කිරීම මගින් කැඳවනු ලැබිය හැකි ය. එකී රැස්වීමෙහි අරමුණු පිළිබඳව ඉල්ලීම ඉදිරිපත් කරන අවස්ථාවේ දීම ගරු ලේකම්ට දැනුම්දිය යුතු ය. එවැනි රැස්වීමක් ඉල්ලීම ඉදිරිපත් කර දින විසි එකක් (21) ඇතුළත පැවැත්විය යුතු ය. විශේෂ මහා සභා රැස්වීම.

17. (1) ආයතනයෙහි සියලුම සාමාජිකයන් වෙත රැස්වීමේ දී සාකච්ඡා කිරීමට බලාපොරොත්තුවන කරුණු පිළිබඳව සඳහන් කර එකී රැස්වීම පැවැත්වීමට දින දහතරක (14) දැනුම්දීමක් නොකර මහා සභා රැස්වීමක් නොපැවැත්විය යුතු ය. රැස්වීම පිළිබඳ දැනුම් දීම සහ මහා සභා රැස්වීමක දී සාකච්ඡා කළ යුතු විෂයයන්.

(2) කිසිම මහා සභා රැස්වීමක දී හෝ ඉන් පසුව එකී රැස්වීම සඳහා වූ දැන්වීමෙහි සඳහන් කර ඇති විෂයයන් හැර වෙනත් කිසිම විෂයයක් සාකච්ඡා නොකළ යුතු ය.

(3) විස්සකට (2) නොඅඩු සාමාන්‍ය සාමාජිකයන් පිරිසක් එක් වී මහා සභා රැස්වීමකට දින විසි එකකට (21) පෙර ගරු ලේකම්ට දැනුම් දී යම් නිශ්චිත කරුණක් හෝ විෂයයක් එකී මහා සභා රැස්වීමේ දී සාකච්ඡා කළ යුතු යැයි ඉල්ලා සිටියහොත් එකී මහා සභා රැස්වීම සඳහා වූ දැන්වීමෙහි මහා සභා රැස්වීමේ දී ඉහත කරුණ හෝ විෂයය සාකච්ඡාවට ලක්වීමට නියමිත බව ද සඳහන් විය යුතු ය. එකී නිවේදනය ඇතුළත් කිරීම හේතුවෙන් ආයතනයට අමතර වියදමක් දැරීමට සිදුවේ නම් එම කරුණ සාකච්ඡා කළ යුතු යැයි යෝජනා කළ සාමාජිකයා විසින් එය දැරිය යුතු ය.

මහා සභා රැස්වීම සඳහා වූ ගණපූරණය.

18. (1) මෙහි උපවගන්ති (3) යටත්ව ගණපූරණය නොමැතිවුවහොත් කිසිම විෂයයක් මහා සභා රැස්වීමේ දී සාකච්ඡා නොකළ යුතු ය.

(2) සාමාන්‍ය සාමාජිකයන්ගෙන් අවම වශයෙන් සියයට විස්සක් (20) සහභාගිවුවහොත් එය මහා සභා රැස්වීමක් සඳහා වූ ගණපූරණය වශයෙන් සලකනු ලැබේ:

එසේ වුව ද, ගණපූරණයක් නොමැතිව සභාපති කෙනෙක් පත්කරගත හැකි ය.

(3) මහා සභා රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවේ සිට මිනිත්තු තිහකට (30) පසුව ගණපූරණයක් දක්නට නොලැබුණහොත් එකී රැස්වීම ඊළඟ සතියේ, එම දිනයේ, එම වේලාවටම එම ස්ථානයේදීම හෝ සභාපති විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් දිනයකට, වේලාවකට, ස්ථානයකට කල් දැමිය යුතු ය.

(4) කල් දමන ලද මහා සභා රැස්වීමක දී නියමිත වේලාවට මිනිත්තු තිහකට (30) පසුව ගණපූරණයක් නොමැතිවුවහොත් පැමිණ සිටින සාමාන්‍ය සාමාජිකයන් ගණපූරණයක් නිර්මාණය කර ඇතුව, සේ සලකනු ලැබේ.

(5) ඉහත උප වගන්ති හතරට (4) යටත්ව නිර්මාණය කර ඇති ගණපූරණයට ශ්‍රී ලංකා රක්ෂණ ආයතන පනතේ (11) සහ (23) වැනි වගන්ති යටතේ සම්මුතියකට එළඹීමේ බලය නොමැත.

*මහා සභා රැස්වීමේ දී ඡන්දය ප්‍රකාශ කිරීම.*

19. මහා සභා රැස්වීමක දී තීරණයක් ගනු ලබන්නේ මහා සභා රැස්වීමට සහභාගි වූ සාමාන්‍ය සාමාජිකයන්ගේ වැඩි ඡන්ද මතයි. මහ සභා රැස්වීමකදී ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව සමාන වුවහොත් සභාපතිට එක් තීරක ඡන්දයක් පාවිච්චි කළ හැකි ය.

*මහා සභා රැස්වීමක සභාපති.*

20. සභාවේ සභාපති සෑම මහා සභා රැස්වීමකදීම මුලසුන හොබවයි. ඔහු නොමැතිනම් උප සභාපති ද ඔහුත් නොමැති නම් සභාවේ සාමාජිකයන්ගෙන් කෙනෙක් මුලසුන හොබවයි. සභා සාමාජිකයන් ද පැමිණ නොසිටිනම් එම අරමුණ සඳහා පැමිණ සිටින සාමාන්‍ය සාමාජිකයන් අතරින් කෙනෙක් මෙම අරමුණ සඳහා තෝරා පත්කරගනු ලබයි.

*මහා සභා රැස්වීම කල් දැමීම.*

21. මහා සභා රැස්වීමක සභාපතිට පැමිණ සිටින සභා රැස්වීමක දී ඡන්දය ප්‍රකාශ කරන සාමාජිකයන්ගේ බහුතරයකගේ කැමැත්ත මත වරින්වර හෝ ස්ථානයෙන් ස්ථානයකට රැස්වීම කල්දැමිය හැකි වුව ද කල්දමන ලද රැස්වීමේ දී සාකච්ඡා කර අවසන් නොවූ කරුණු ඇතොත් එය හැර වෙනත් කරුණු පිළිබඳව සාකච්ඡා නොකළ යුතු ය. කල්දැමීමේ තීරණය එසේ සිදුකර නොතිබුණහොත් කල්දැමීම පිළිබඳව කිසිම නිවේදනයක් ලබා දෙනු නොලැබේ.

*මුදල් විධිවිධාන.*

22. (1) සභාව, එහි පරිපාලනය යටතේ සහ පාලනය යටතේ අරමුදලක් නිර්මාණය කර එය පවත්වාගෙන යයි. සභාවට ලැබිය යුතු සියලුම මුදල් එයට ගෙවිය යුතු අතර, මෙම පනත යටතේ සභාවේ බලය සහ ක්‍රියාකාරකම් මෙහෙයවීමේ දී සභාව විසින් දරනු ලබන සියලු වියදම් සහ වගකීම් දරනු ලබන්නේ අරමුදල විසිනි.

(2) සභාව ශ්‍රී ලංකාවේ බැංකුවක හෝ බැංකුවල ගිණුමක් හෝ ගිණුම් පවත්වාගෙන යනු ඇත.

(3) සභාවේ වාර්ෂික ගිණුම් සෑම වර්ෂයකදීම වාර්ෂික මහා සභා රැස්වීමේ දී විගණන අරමුණු සඳහා පත්කරනු ලබන වරලත් ගණකාධිකාරින් විසින් විගණනයට ලක්විය යුතු ය.

(4) සභාවේ සෑම මූල්‍ය වර්ෂයක්ම අවසන් වූ වහාම ඉකුත් වර්ෂයේ විගණනය කරන ලද වාර්ෂික වාර්තාවේ පළකළ යුතු අතර, එහි පිටපත් ආයතනයේ සෑම සාමාජිකයන්ට ලබාදිය යුතු ය.

### ආයතන කළමනාකරණය

ප්‍රධාන නිලධාරී.

23. ආයතනයේ දෛනික කටයුතු පරිපාලනය කිරීම සඳහා සභාව විසින් ප්‍රධාන විධායක නිලධාරියකු පත්කරනු ඇත.

ප්‍රධාන නිලධාරිගේ වගකීම් සහ ක්‍රියාකාරකම්.

24. ප්‍රධාන විධායක නිලධාරිවරයා—

(i) ආයතනයේ දෛනික කටයුතු සහ මෙහෙයුම් කළමනාකරණය කරයි;

(ii) සභාපති සමග සාකච්ඡා කර ආයතනයේ දියුණුව සහ වර්ධනය සඳහා උපාය ව්‍යාපාර සැලසුම් නිර්මාණය කර වාර්ෂිකව එය යාවත්කාලීන කර අනුමැතිය සඳහා සභාවට ඉදිරිපත් කරයි;

(iii) සභාව විසින් අනුමත කරනු ලැබීමෙන් අනතුරුව සභාපති සමග සාකච්ඡා කර උපාය ව්‍යාපාර සැලසුම් නිර්මාණය කර, එය පිළිපැද ක්‍රියාත්මක කරයි;

(iv) සෑම සේවකයකුගේම බලතල සීමා සහ රාජකාරියෙහි සීමාව ඇතුලු බැංකු ගිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ උපදෙස් ඇතුලු ආයතනයේ ආයතනික සැකිල්ල නිර්මාණය කර, සභාවේ අනුමැතිය සඳහා එය ඉදිරිපත් කරයි;

(v) ආයතනය සභාව විසින් පිළිගෙන ඇති ආයතනික සැකිල්ල අනුව ක්‍රියාත්මකවීම සහතික කරයි;

(vi) සභාව විසින් වරින් වර ඉල්ලා සිටිනු ලබන ආකාරයේ කළමනාකරණ තොරතුරු සමග සභාව විසින් නිර්දේශ කරනු ලබන ආකාරයට අඛණ්ඩව සභාවට ඉදිරිපත් කරයි;

(vii) ආයතනයේ කීර්ති නාමයට සහ/හෝ වර්ධනයට බලපෑමට සමත් යම් විෂයයන් පිළිබඳව තොරතුරු ලද විගස ඒ පිළිබඳව සභාව දැනුවත් කළ යුතු අතර,

ආයතනය විසින් අත්‍යවශ්‍යයෙන්ම දිය යුතු පිළිතුරු හෝ පියවර පිළිබඳව සැලසුමක් සකස් කර සභාපතිගේ හෝ ඔහු නොමැතිනම් එම අවස්ථාවේදී සම්බන්ධ විය හැකි සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය;

(viii) සභාව විසින් වරින් වර නිර්දේශ කරනු ලබන අනෙකුත් කටයුතු සහ වගකීම් ඉටු කිරීම.

සේවකයන්.

25. ආයතනයේ සියලුම සේවකයන්ට ප්‍රධාන විධායක නිලධාරි වගකිව යුතු අතර, පනතේ (15) වෙනි වගන්තියට යටත්ව සේවකයන්ගේ සේවා නියමයන් උල්ලංඝනය වීම පිළිබඳ පැමිණිලි විභාග කිරීම සඳහා සභාව විසින් කමිටුවක් පත් කරනු ඇත.

26. රීති අංක (23) ට යටත්ව කමිටුව විසින් සේවකයකු වැරදිකරු යැයි තීරණය කරනු ලැබුවහොත්, එකී සේවකයාට එරෙහිව ගතයුතු විනය කටයුතු පිළිබඳව සභාවට නිර්දේශ කරනු ඇත.

27. රීති අංක (24) ට යටත්ව කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගත් සභාව සුදුසු යැයි අදහස් කරන ඉහත පියවර හෝ වෙනත් විනය පියවරක් සාමාන්‍ය බහුතරයකට යටත්ව ක්‍රියාත්මක කරයි:

එසේ වුව ද, සේවකයකු සේවයෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් එම තීරණය සභාවේ ඒකමතික තීරණයකින් සම්මත කර දැනට පවතින සභාවේ සියලු සාමාජිකයන් විසින් සම්මත විය යුතු ය.

## නානාවිධ වගන්ති

විගණනය.

28. ශ්‍රී ලංකාවේ සේවය කරන වරලත් විගණන නිලධාරියකු වාර්ෂික මහා සභා රැස්වීමකට සහභාගි වී සිටින සාමාන්‍ය සාමාජිකයන්ගෙන් සාමාන්‍ය බහුතර කැමැත්ත අනුව ආයතනයේ විගණන නිලධාරියකු වශයෙන් පත්කරනු ලැබේ.

29. සභාවක නිල කාලය තුළ අවම වශයෙන් අභ්‍යන්තර විගණනයන් දෙකක් (2) සභාව විසින් සිදු කළ යුතු ය.

"වෘත්තීය අවකල් ක්‍රියාව" යන්නෙහි තේරුම.

30. ශ්‍රී ලංකා රක්ෂණ ආයතන පනතට අනුව "වෘත්තීය අවකල් ක්‍රියාව" යන්නෙහි තේරුම, දූනට වෘත්තීය අවකල්ක්‍රියාව වශයෙන් මහා සභා රැස්වීමක දී සාමාජිකයන් විසින් නිර්දේශ කර ඇති ක්‍රියාකලාපයක් හෝ වැරැද්දක් වේ.

31. සාමාජිකයන් විසින් "වෘත්තීය අවකල්ක්‍රියාව" යනුවෙන් නිර්දේශ කර ඇති විධිවිධාන එකක් හෝ සියල්ල සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ එකතු කිරීමට හෝ සාමාජිකයන්හට හැකියාව පවතී.